සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (I) (2018)

## (03) සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම

### I කොටස - සාමාන්‍ය පරිපාලනය

පැ එකයි මිනිත්තු තිහයි

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. ජාතික ලේඛනාරක්ෂක පනත (1973) සහ එහි සංශෝධිත පනත (1981) අනුව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සතු බල අධිකාරිය සහ රාජකාරි වගකීම් පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

2. 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත අනුව එම මණ්ඩලයේ කාර්යභාරය විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

3. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව 'මූලික අයිතිවාසිකම්' කවරේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

4. 1994 අංක 11 දරන විද්‍යා හා තොරතුරු සංවර්ධන පනත මගින් පිහිටුවා ඇති තාක්ෂණ තොරතුරු සභාවෙහි (සින්ටෙක්/CINTEC) සංයුතිය කෙසේ විය යුතු දැයි විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

5. රාජකාරි ලිපි ලේඛන විනාශ කිරීමේ දී අනුගමනය කළ යුතු නෛතික විධි විධාන සහ කාර්යභාරය විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

6. පහත සඳහන් මාතෘකා පිළිබඳව ආයතන සංග්‍රහය හා අදාළ පනත් ඇසුරින් කෙටි සටහන් ලියන්න.
   (i) සංයුක්ත දීමනාව
   (ii) සේවා සහතිකය
   (iii) බුද්ධිමය දේපළ පනත බලගන්වන අධ්‍යක්ෂ ජනරාල්ගේ අධිකාරි බලය
   (iv) ආපදා ණය
   (v) රාජකාරි නිවාඩු

*(ලකුණු 02 × 5 = 10 යි)*

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන
කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (I) (2018)

**(03) සාමාන්‍ය පරිපාලනය හා මූල්‍ය ක්‍රම**

**II කොටස - මූල්‍ය ක්‍රම**

පැ. එකයි මිනිත්තු තිහයි

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

1. (i) 'ගණන් දීමේ නිලධාරියා' යනු කවරෙක් ද?
   (ii) මුදල් රෙගුලාසි 128 අනුව ගණන් දීමේ නිලධාරියකු රජයේ කටයුතු ඉටු කිරීමේ දී ඔහුගෙන් රජය අපේක්ෂා කරනු ලබන ගුණාංග පහක් සඳහන් කරන්න.
   *(ලකුණු 10 යි)*

2. (i) 'අභ්‍යන්තර විගණනය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
   (ii) රජයේ දෙපාර්තමේන්තුවක් විසින් ගෙවීම් කටයුතු සඳහා භාවිත කරනු ලබන විවිධ වවුචර් වර්ග පහක් ඒවායේ පොදු ආකෘති පත්‍ර අංකය සමග සඳහන් කරන්න.
   *(ලකුණු 10 යි)*

3. (i) 'උපලබ්ධි නොවූ චෙක්පතක්' යනුවෙන් හඳුන්වන්නේ කවරක් ද?
   (ii) චෙක්පතක් බැංකුව විසින් අගරු කිරීමට සිදුවන අවස්ථා පහක් සඳහන් කරන්න.
   *(ලකුණු 10 යි)*

4. රජයේ නිලධාරියකුගේ වැටුපට අදාළව 40% සීමාවෙන් නිදහස් කෙරෙන ව්‍යවස්ථාපිත නොවූ අඩුකරණ මොනවා දැයි සඳහන් කරන්න.
   *(ලකුණු 10 යි)*

5. මුදල් රෙගුලාසි 135 යටතේ රජයේ ආදායම් සම්බන්ධයෙන් බලය පවරනු ලබන අවස්ථා කෙටියෙන් විස්තර කරන්න.
   *(ලකුණු 10 යි)*

6. කෙටි සටහන් ලියන්න.
   (i) පුස්තකාල කළමනාකරණ පද්ධතිය (Library Management System)
   (ii) ගබඩා භාරකරු
   (iii) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ අරමුණු
   (iv) බැංකු අයිරාව
   (v) පුනරාවර්තන වියදම්
   *(ලකුණු 02 × 5 = 10 යි)*

* * *

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන
කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (I) (2018)

**(04) පුස්තකාල සංවිධානය**

පැ තුනයි

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** 'ලිඛිත එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් (written collection development policy)' යනු කුමක් දැයි හඳුන්වා, ඉන් පුස්තකාලයට ලැබෙන වාසි පිළිබඳ විමසීමක් කරන්න. *(ලකුණු 25 යි)*

**2.** පුස්තකාල ගොඩනැගිල්ලක් සැලසුම්කරණයේ දී අදාළ ගෘහ නිර්මාණ ශිල්පියා වෙත පුස්තකාලයාධිපති විසින් කරනු ලබන පැහැදිලි කිරීමේ අන්තර්ගත විය යුතු කරුණු සාකච්ඡා කරන්න. *(ලකුණු 25 යි)*

**3.** තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේත්, ප්‍රකාශන ක්ෂේත්‍රයේත් සිදුවෙමින් පවතින වෙනස්වීම්වලට අදාළ ව ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තිකයන්ගේ අවධානය යොමු විය යුතු ප්‍රවණතා පහක් නම් කර, ඉන් දෙකක භාවිතයන් විවරණය කර දක්වන්න. *(ලකුණු 25 යි)*

**4.** (i) පුස්තකාලයකට අවශ්‍ය පොත් තේරීම සඳහා ආචාර්ය රංගනාදන් ඉදිරිපත් කළ මූලධර්ම පිළිබඳ විමසීමක් කරන්න. *(ලකුණු 10 යි)*

(ii) වාර සඟරා එකතු කළමනාකරණයේ (collection management) ප්‍රධාන ගැටලු තුනක් නම් කර, ඉන් එක් ගැටලුවක ස්වභාවය විශ්ලේෂණය කර දක්වන්න. *(ලකුණු 15 යි)*

**5.** පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ අන්තර්ජාතික සංවිධාන තුනක් නම් කර, ඉන් එක් ආයතනයක කාර්යභාරය ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තිකයන්ගේ වෘත්තිය සංවර්ධනයට දායකවන ආකාරය ඇගැයීමට භාජනය කරන්න. *(ලකුණු 25 යි)*

**6.** පහත සඳහන් මාතෘකා අතුරින් පහක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) රාජ්‍ය ප්‍රකාශන (Government Publications)
(ii) මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය (Maslow's Hierarchy of Needs)
(iii) සිතියම් විද්‍යාත්මක ද්‍රව්‍ය (Cartographic Material)
(iv) පුස්තකාල සමීක්ෂණ (Library Surveys)
(v) ගාන්ට් සටහන (Gantt Chart)
(vi) අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය (International Standard Book Number)
(vii) වාර්ෂික සැලැස්ම (Year Plan)

*(ලකුණු 05 × 5 = 25 යි)*

* * *

Department of Examinations Sri Lanka